# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබා දීමේ අත්වැලකි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

තාක්ෂණික පත්‍රිකා අංක **09 - 2016 අගෝස්තු**


## වටපණු හානියෙන් තොර පේර වගාවක් !

එළඹෙන මහ කන්නයේදී ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිත අතර අනිවාර්යයෙන්ම පේර බෝගය ද වගා කෙරෙනු ඇත. පේර වගාව සඳහා වටපණු හානිය විශාල තර්ජනයකි. ඒ බව මධ්‍යම පළාත් ක්‍රියාකාරී කමිටු රැස්වීමේදී හා මහවැලි ක්‍රියාකාරී කමිටු රැස්වීමේදී තහවුරු විය. එබැවින් වටපණු හානියෙන් තොර පේර වගාවක් පවත්වා ගැනීම සඳහා ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ ආයතනය විසින් ක්‍රමවේදයක් ඉදිරිපත් කර ඇති අතර එය ඉතාමත් සාර්ථක ක්‍රමයක් බව කල්පිටිය ප්‍රදේශයේදී කළ පරීක්ෂණ වලින් තහවුරු වී ඇත. එබැවින් එළඹෙන මහ කන්නයේදී මෙම ක්‍රමය අනුගමනය කර නීරෝගී, වටපණු හානියෙන් තොර පේර වගාවක් පවත්වාගෙන යා හැක.

වටපණු හානිය පාලනයේදී සළකා බැලිය යුතු ප්‍රධාන කරුණ වන්නේ වටපණුවන් ශාකයට ඇතුල්වීමට පෙර සිටම පාලන ක්‍රම අනුගමනය කිරීමයි. ඒ සඳහා ඒකාබද්ධ පාලන ක්‍රමවේදයන් අනුගමනය කර ගැනීම සඳහා පහත ක්‍රමවේදය අනුගමනය කළහැක.

### නව වගාවක් ස්ථාපනයේදී



**පැළ සිටුවීමට සකස් කරන ලද වළක්**

- අඩි 2x2x2 ප්‍රමාණයේ වළක් කපා එයට කුකුල් පොහොර කිලෝ ග්‍රෑම් 25-30 ක් මතුපිට පස් සමග මිශ්‍ර කර, වළ පුරවන්න
- පසුව කුකුල් පොහොර යොදා සකස් කරන ලද වළට අඛණ්ඩව දින 5 ක් ජල සම්පාදනය කරන්න
- සති දෙකකට පමණ පසු කුකුල් පොහොර යොදා සකස් කර ගන්නා ලද වළෙහි පස බුරුල් කර නැවත කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 10 ක් පමණ යොදා නිරෝගී පැළ සිටුවන්න



**වටපණුනාශකයකින් පාංශු ප්‍රතිකාර කිරීම**

- පැළය සිටවූ විගස පැළයේ මුල අවට ප්‍රදේශය හොඳින් තෙමී යන පරිදි වටපණුනාශකයක් යොදන්න

### පැළය සිටුවා මාසයකට පසු



කාණුවට පිටතින් බේසමක් ආකාරයට
කවාකාර ගැට්ටක් සකස් කිරීම

- පැළයට අඩි දෙකක් පමණ දුරින් මුල් වලට හානි නොවන පරිදි පැළය වටා කවාකාරව කාණුවක් සකස් කරන්න
- එයට කුකුල් පොහොර කිලෝග්‍රෑම් 20-30 පමණ යොදා නැවත හොඳින් පස් සමඟ මිශ්‍ර කරන්න
- මෙම කාණුවට පිටතින් බේසමක් ආකාරයට කවාකාර ගැට්ටක් සකස් කර මූල මණ්ඩල ප්‍රදේශයට වටපණුනාශකයක් යොදන්න

### පැළය සිටුවා මාස දෙකකට පසු



පැළය වටා කවාකාරව සකස් කර ගන්නා
ලද කාණුවට කුකුල් පොහොර යෙදීම

- ශාකයට අඩි තුනක් පමණ දුරින් මුල් වලට හානි නොවන පරිදි ශාකය වටා කවාකාරව කාණුවක් සකස් කරන්න
- එයට කුකුල් පොහොර කිලෝග්‍රෑම් 20-30 ක් පමණ යොදා හොඳින් පස් සමඟ මිශ්‍ර කරන්න
- මෙම කාණුවට පිටතින් බේසමක් අකාරයට කවාකාර ගැට්ටක් සකස් කර මූල මණ්ඩල ප්‍රදේශයට වටපණුනාශකයක් යොදන්න

### පැළය සිටුවා මාස තුනේදී හා හතරේදී

- ඉහත ආකාරයටම කාණු සකස් කර කුකුල් පොහොර යොදා කාණුවට පිටතින් කවාකාර ගැට්ට සකස් කරන්න
- වටපණුනාශකය වෙනුවට ට්‍රයිකොඩෝමා දිලීරය අඩංගු කාබනික පොහොර කිලෝග්‍රෑම් 15 ක් පමණ ගස මුලට විසුරුවා හරින්න

### වගාවට මාස හයක් ගතවූ පසු

- නැවත ශාක වල වටපණු හානියේ මූලික ලක්ෂණ පෙන්නුම් කරයි නම් ශාකයේ මූල මණ්ඩල කලාපයට වටපණුනාශකයකින් ප්‍රතිකාර කරන්න
- මෙහිදී මසකට වරක් ලෙස අවස්ථා දෙකකදී පමණක් වටපණුනාශකය භාවිතා කළ යුතුය
- අවශ්‍ය නම් නැවත යෙදීම කළ යුත්තේ අවම වශයෙන් අවසන් යෙදීමෙන් මාස හයකට පසුවය

---

වැඩිදුර විස්තර සඳහා : කේ.එම්.ඩී.ඩබ්. ප්‍රභාත් නිශාන්ත, පර්යේෂණ නිලධාරී
උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය

සැකසුම : චාමරි නිලූෂි සිල්වා, කෘෂිකර්ම උපදේශක (සන්නිවේදන)
අධීක්ෂණය හා උපදෙස් : ඩබ්.ඒ.පී. සිසිර කුමාර, අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන)